# කම්මැලි තණකොළ පෙත්තා



ලියොනි ඩියෙන්කා කරුණාරත්න

# කම්මැලි
# තණකොළ පෙත්තා

ලියෝනි ඩියෙන්කා කරුණාරත්න

# කම්මැලි තණකොළ පෙත්තා

කතෘ ප්‍රකාශනයකි

ලියෝනි ඩියෙන්කා කරුණාරත්න

4 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විද්‍යාලය

මුද්‍රිත දිනය

කතෘගේ වෙනත් කෘතීන්

ISBN- 978-624-208-182-3

# පිදුම

සැමදා සිප් සතර උගන්වන

යහ ගුණ කියා දෙන

නිරංජලා වීරසිංහ ගුරු මෑණියන් හට

හද පිරි සෙනෙහසින් හා භක්තියෙන්

මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද  නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද  සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම   සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින්  ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය  
ශශිකලා සේනාධීර  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කැලෑවක තරුණ තණකොළ පෙත්තෙක් ජීවත් වුණා. මේ තණකොළ පෙත්තාගේ වැඩේ සිංදු කිය කියා හැම තැනම ඇවිදින එක.




මෙයා හරිම කම්මැලි තණකොළ පෙත්තෙක්. හැම තිස්සෙම යාළුවොන්ගෙන් ඉල්ලගෙන හරි ඒ වෙලාවට කෑම ටිකක් හොයා ගෙන හරි කන්න පුරුදු වෙලා හිටියේ.



ඒ වුණාට එයාගේ හොඳම යාළුවෝ කණාමැදිරියයි. අනිත් සත්තු ඔක්කොමයි ලඟ එන වැහි කාලයට ලෑස්ති වුණා.



ඒ වුනාට මේ කම්මැලි තණකොළ පෙත්තා අනිත් අයට විහිලු කර කර නිතරම සිංදු කිය කිය කම්මැලි කමින් කාලය ගත කළා.



ඔන්න යාළුවනේ වැහි කාලය පටන් ගත්තා. හැමෝටම විහිලු කල තණකොළ පෙත්තට හරි වැඩේ වුණේ. එයත් අනිත් යාළුවෝ වගේ ගේ ඇතුලේ හිටියට ගේ ඇතුලේ කන්න මොකුත් තිබ්බේ නෑ.



මොකද එයා වැහි කාලෙ කිසිම ලෑස්තියක් වුණේ නෑ. ඉතින් තණකොළ පෙත්තට හොඳටම බඩගිනි. එයා මහ වැස්සෙම තෙමි තෙමි කණාමැදිරියා ගේ ගෙදරට ගියා.



ගිහින් දොරට තට්ටු කරත් එයාට

කිසිම දෙයක් ඇහුණේ නෑ.

තණකොළ පෙත්තා ලොකු වතුර

පාරක් ඇවිත් ගසාගෙන ගියා.

මේ වෙච්චදේ ගමේ කිසිම කෙනෙක්

දන්නේ නෑ.



වැහි කාලේ ඉවර වෙලා ගමේ හැමෝම එළියට ආවා. එතකොට එයාලා දැක්කා තණකොළ පෙත්තා ගම මැද වැටිලා ඉන්නවා. හැමෝම එකතුවෙලා එයාට බෙහෙත් කළා.




තණකොළ පෙත්තා මෙහෙම කිව්වා.
"මමත් අද ඉඳන් කම්මැලි නොවී
වැහි කාලෙට ලෑස්ති වෙනවා"
කියලා.



තණකොළ පෙත්තාට සුව වුණා.
හැමෝටම විහිළු කරපු තණකොළ
පෙත්තා හැමෝටම ස්තුති කළා.
මේක අහපු කණාමැදිරියා මෙහෙම
කිව්වා.



. එහෙම නම් අපි අදම කැම
හොයන්න පටන් ගමු කියලා
. "හැමෝම කෑම හොයාගෙන
කැලේට පිටත් වුණා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්